**මහ කොළඹ ජලය හා අපජලය කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන - 01 ව්‍යාපෘතිය - 2020.**

---

මහ කොළඹ ජලය හා අප ජලය කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන - 01 ව්‍යාපෘතියේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2013 ජුනි 28 දින එළඹි අංක 2947-එස්.ආර්.අයි සහ අංක 2948- එස්.ආර්.අයි (එස්.එෆ්) දරණ ව්‍යාපෘති ගිවිසුමේ පරිච්ඡේද II හි 2.10(a) වගන්තිය සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 වැඩසටහන ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා වැඩසටහනේ කාලය**

වැඩසටහනේ ව්‍යාපෘතිය හා ණය ගිවිසුම්වලට අනුව, ව්‍යාපෘති 01 එවකට ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය වර්තමානයේ ජල සම්පාදන අමාත්‍යාංශය වැඩසටහන ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. වැඩසටහනේ අරමුණු වනුයේ, නාගරික පරිසරය වැඩිදියුණු කිරීම හා මහ කොළඹ ප්‍රදේශයේ නිවැසියන්ගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම වේ. වැඩසටහනේ අරමුණු වනුයේ (අ) කොළඹ නගරයේ ජල සම්පාදන පද්ධතිය පුනරුත්ථාපනය කිරීම සහ පුළුල් කිරීම සහ ආදායම් නොලබන ජලය අඩු කිරීම (ආ) මහ කොළඹ ප්‍රදේශයේ අප ජලය සේවා වැඩිදියුණු කිරීම (ඇ) ආයතනික ව්‍යුහය ශක්තිමත් කිරීම සහ සේවා සපයන්නන්ගේ ධාරිතාවය වැඩිදියුණු කිරීම (ඈ) ආයෝජන වැඩසටහන කළමනාකරණය කිරීම හා ක්‍රියාත්මක කිරීම වේ. ණය ගිවිසුම් අනුව, වැඩසටහනේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 14,784 කට සමාන එ.ජ.ඩො. මිලියන 112 ක් වන අතර ඉන් රු.මිලියන 11,088 කට සමාන එ.ජ.ඩො. මිලියන 84 ක් මූල්‍යයනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. ඉතිරි මුදල වන රු.මිලියන 3,696 කට සමාන එ.ජ.ඩො. මිලියන 28 ක් සඳහා ශ්‍රී ලංකා රජය විසින් දායක වීමට අපේක්ෂා කරයි. වැඩසටහන එහි කටයුතු 2013 සැප්තැම්බර් 25 දින ආරම්භ කරන ලද අතර, 2016 දෙසැම්බර් 31 වන විට නිමකිරීමට සැලසුම් කර තිබුණි. පසුව, වැඩසටහනේ කාලපරිච්ඡේදය 2022 ඔක්තෝම්බර් 24 දක්වා සිව්වරක් දීර්ඝ කර තිබුණි.

**1.3 තත්ත්වාගණනය කළ මතය**

ඉහත වාර්තාවේ 2.1 වගුවෙන් විස්තර කර ඇති කරුණුවල බලපෑම හැර, වැඩසටහනේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරිත්වය හා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළිබඳව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මාගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

වැඩසටහනේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වේද යන්න පිළිබඳව සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීමක් උසස් මට්ටමේ සහතිකවීමක් නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව සිදු කරන විගණනයේදී සැමවිටම පවත්නා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් ලබා නොදේ. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන් ප්‍රකාරව විගණනය කිරීමේදී කොටසක් ලෙස මාගේ විගණන පුරාම වෘත්තීය විනිශ්චය ක්‍රියාත්මක කිරීම හා වෘත්තීය සැක මුසුව පවත්වා ගැනීම සිදු කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස වැඩ සටහනේ ව්‍යාපෘති 01 හි අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල අදාලත්වය සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත්ව මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම.

2.1. ගිණුම්කරණ අඩුපාඩු

| අනු අංක | ගිණුම්කරණ අඩුපාඩු | වටිනාකම රු. මිලියන | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| (අ) | 2013 වර්ෂය සිට 2020 දක්වා ණය දෙන ආයතනය විසින් අය කරන ලද රු.මිලියන 795 ක පොලී හා බැඳීම් ගාස්තු භාණ්ඩාගාර ප්‍රධාන යටතේ වැරදි ලෙස දක්වා ඇති අතර එයින් 2019 දෙසැම්බර් 31 දක්වා අය කරන ලද රු.මිලියන 616 ක් පූර්ව වර්ෂ ගැලපීමක් ලෙස ගැලපීම වෙනුවට වත්මන් වර්ෂයේ ගනුදෙනු ලෙස මූල්‍ය ප්‍රකාශන වලට ගලපා ඇත. | 795.44 | අනාගත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අපි විගණනකගේ නිර්දේශ අනුගමනය කරන්නෙමු. | මූල්‍ය තත්ව ප්‍රකාශනයේ, ඒඩීබී ණය මුදල් ලැබීම් ලෙස ගිණුම් තැබීමට පියවර ගැනීම සහ භාණ්ඩාගාර ප්‍රධානයන් ගැලපීමට පියවර ගත යුතුය. |
| (ආ) | රු.මිලියන 226.99 ක විනිමය ලාභය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ අරමුදල් මූල්‍යනය යටතේ, වෙනම පෙන්වනවා වෙනුවට වැරදි ලෙස කල වැඩ වටිනාකමින් අඩු කර තිබුණි. | 226.99 | අනාගත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අපි විගණනකගේ නිර්දේශ අනුගමනය කරන්නෙමු. | මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ විනිමය ලාභය අරමුදල් මූල්‍යනය යටතේ වෙනම පෙන්විය යුතුය. |
| (ඇ) | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ව්‍යාපෘතිය වෙනුවෙන් මහජන බැංකුවට ගෙවන ලද රු.මිලියන 182.55 ක ණය පොලිය සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට ගෙනැවිත් නොතිබුණි. | 182.55 | මෙම සටහන ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම අවසන් වූ පසුව ජා.ජ.ස. හා.ජ.ම. ලෙජරයේ යාවත්කාලීන කර ඇත. සටහන පසුව ව්‍යාපෘති ගිණුම් පොත්වල සටහන් කරන ලදී. | ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාහන පිළියෙල කිරීමට පෙර අදාල සියලු වියදම් හඳුනා ගැනීමට හා ගිණුම් තැබීමට ක්‍රියා කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) 2017 වර්ෂයේ රු.මිලියන 15.79 ක එකතු කල අගය මත බදු රජයේ දායකත්ව ලැබීම්වලට එරෙහිව ගලපා ඇත. කෙසේ වෙතත්, එය 2021 පෙබරවාරි 12 දිනැති ගිණුම් උපදෙස් චක්‍රලේඛන අංක 01 2021 ප්‍රකාරව රජයේ දායකත්වයට ගෙන ඒම සහ එකතු කළ අගය මත බදු වෙනම මූල්‍ය ප්‍රකාශන වල පෙන්වීමට ක්‍රියාකර නොමැත. | 15.79 | 2017 වර්ෂයේ ශ්‍රී ලංකා රජයේ ලැබීම් වලට හිලව් කරන ලද රු.16,343,433.60 ක් වූ මුදල් ප්‍රමාණය ජා.ජ.ස.ජ.ම. විසින් හිමිකම් ලබාගන්නා ලදී. ඉහත සඳහන් චක්‍රලේඛණය අදාල වන්නේ වැය ශීර්ෂ මත එකතුකල අගය මත බදු සඳහා පමණි. | මූල්‍ය ප්‍රකාශනවල රජයේ දායකත්වය යටතේ ගිණුම්ගත කිරීමට සහ එකතු කල අගය මත බදු අගයන් ලෙස වෙනම පෙන්වීමට පියවර ගත යුතුය. |

**2.2 නීති රෙගුලාසිවලට අනුකූල නොවීම**

| නීතී රීති රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම/ විගණන ගැටලුව | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| 2019 මාර්තු 15 දිනැති අංක 01/2019 දරණ කළමණාකරණය සේවා චක්‍ර ලේඛනයේ 2.3.2 උප වගන්තියට අනුව | කාර්යක්ෂම ව්‍යාපෘති කළමණාකරණය සහතික කර ගැනීම සඳහා ව්‍යාපෘති අධ්‍යක්ෂකවරයා සෑම විටම පූර්ණ කාලීනව රාජකාරියේ යෙදිය යුතු නමුත් ඔහු ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අතිරේක සාමාන්‍යාධිකාරී ලෙස උසස් වීම් ලබා ඇති අතර ඒම නිසා ඔහුගේ සේවාවන් ව්‍යාපෘතියට පූර්ණ කාලීනව ලබා ගැනීමට නොහැකි වී ඇත. | නව තනතුර කළමනණාකරන සේවා දෙපාර්තමේන්තුව විසින් තවමත් තහවුරු කර නොමැති අතර එය වැඩ බලන තනතුරක් පමණි. කවද, ව්‍යාපෘති අංක 01 අවසාන අදියරේ පවතී. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ තහවුරු කිරීම් මත පදනම්ව ව්‍යාපෘති අධ්‍යක්ෂක තනතුර වෙනස් කිරීමේ තීරණයට ජා.ජ. ස.ජ. ම. කළමනාකාරීත්වය විසින් තීරණය කරණු ඇත. | ව්‍යාපෘතියේ කටයුතු කඩිනම් කිරීම සඳහා ව්‍යාපෘති අධ්‍යක්ෂකවරයාගේ පූර්ණ කාලීන සේවාවන් ලබා ගැනීම කටයුතු කල යුතුය. |

**3. භෞතික කාර්ය සාධනය.**

**3.1 භෞතික ප්‍රගතිය.**

ව්‍යාපෘතියේ ප්‍රගති වාර්තාවට අනුව, 2020 දෙසැම්බර් 31 වන ව්‍යාපෘතියේ සමස්ථ භෞතික ප්‍රගතිය සියයට 83.44 ක් කෙසේ වෙතත් සමාලෝචනය කරන ලද වර්ෂය තුළදී ව්‍යාපෘතියේ ප්‍රගතිය අත්පත් කරගෙන ඇත්තේ, සියයට 8.22 ක් පමණි. ව්‍යාපෘතියේ එක් එක් සංරචකවල සමුච්චිත කාර්ය සාධනය පහත පරිදි විය.

| අනු අංක | ක්‍රියාකාරකම් | ඒකකයන් | අපේක්ෂිත ඉලක්ක | 2020 දෙසැම්බර් 31 දිනට ඉලක්ක ලගාකර ගැනීම් | විගණන ගැටළුව | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශයන් |
|---|---|---|---|---|---|---|---|
| (අ) | කොළඹ නගරයේ උතුරු කොටසේ ආදායම් නොවන ජලය අඩුකිරීම සඳහා වන පද්ධති පුනරුත්ථාපනය. (අයි.සී.බී - 1) | | | | කොළඹ නගරයේ ආදායම් නොවන ජලය සියයට දහඅටක අපේක්ෂිත ඉලක්කයට අඩු කර ගැනීමට අසමත් වී තිබුණි. | ප්‍රගති අනුපාතයට ප්‍රධාන වශයෙන් පහත සඳහන් හේතු බලපා ඇත.<br>• මුල් විෂය පථයේ වූ නල ඇතිරීමේ දිග වැඩි කිරීම<br>• අනෙකුත් බලධාරීන් විසින් ඉටු කරන ලද කාර්යයන්හි දුෂ්කරතා<br>• අයහපත් කාල ගුණය<br>• ත්‍රස්ත ප්‍රහාර<br>• කොවිඩ් 19 වසංගතය<br>• සියයට 18.1 අඩු කර සම්පූර්ණ කරන ලද දිස්ත්‍රික් මිනුම් ඒකක සංඛ්‍යාව 06කි. | සංශෝධිත කාල රාමුව තුල නිම කිරීම සඳහා නිතිපතා වැඩ කටයුතු සමීපව අධීක්ෂණය කිරීම අවශ්‍ය වේ. |
| | • නල ඇතිරීම් කාර්යයන් | මීටර් | 206,229 | 205,448 | | | |
| | • සම්බන්ධතා මාරු කිරීම්.(සම්පූර්ණ කරන ලද) | නිවාස හිමියන් | 34,212 | 26,918 | | | |
| | • සම්පූර්ණ කර ජා.ජ.ස.හා.ජ.ම. බාර දෙන ලද දිස්ත්‍රික් මිනුම් ප්‍රදේශ. | ඒකක | 16 | 06 | | | |
| | • සමස්ථ කොන්ත්‍රාත් කාර්ය සාධනය | ප්‍රතිශතය | 99.54 | 97.16 | | | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (ආ) | කොළඹ නගරයේ නැගෙනහිර කොටසේ ආදායම් නෙවන ජලය අඩුකිරීම සඳහා වන පද්ධති පුනරුත්ථාපන (අයි.සී.බී.02) | | | | කොළඹ නගරයේ ආදායම් නොවන ජලය සියයට දහඅටක අපේක්ෂිත ඉලක්කයට අඩු කර ගැනීමට අසමත් වී තිබුණි. | ප්‍රගති අනුපාතයට ප්‍රධාන වශයෙන් පහත සඳහන් හේතු බලපා ඇත.<br>• මුල් විෂය පථය වූ නල ඇතිරීම් දිග වැඩි කිරීම.<br>• අනෙකුත් බලධාරින් විසින් කරන ලද කාර්යයන්හි දුෂ්කරතා<br>• අයහපත් කාල ගුණය<br>• ත්‍රස්ත ප්‍රහාර<br>• කොවිඩ් 19 වසංගතය<br>• සියයට 18 අඩු කර සම්පූර්ණ කරන ලද දිස්ත්‍රික් මිනුම් ඒකක සංඛ්‍යාව 04කි. | සංශෝධිත කාල රාමුව තුල නිම කිරීම සඳහා නිතිපතා වැඩ කටයුතු සමීපව අධීක්ෂණය කිරීම අවශ්‍ය වේ. |
| | • නල ඇතිරීම්.(ප්‍රධාන පෝෂක ඇතුළුව) | මීටර් | 244,279 | 221,034 | | | |
| | | නිවාස හිමියන් | 26,251 | 10,868 | | | |
| | • සම්බන්ධතා මාරු කිරීම්.(සම්පූර්ණයෙන් නිම කරන ලද) | ඒකක | 20 | 04 | | | |
| | • සම්පූර්ණයෙන් නිම කල දිස්ත්‍රික් මිනුම් ඒකක ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට භාරදීම්. | ප්‍රගතිය | 74.52 | 71.09 | | | |
| | • සමස්ථ කොන්ත්‍රාත් ප්‍රගතිය. | | | | | | |
| (ඇ) | මාලිගාකන්ද ආදායම් නොවන ජලය සඳහා වන ගොඩනැගිල්ල ඉදිකිරිම. | ප්‍රතිශතය | 100 | 73.54 | ආදායම් නොවන ජලය සඳහා වන ගොඩනැගිල්ල නිම කිරීම ප්‍රමාද වීම. | ව්‍යාපෘතියේ අවසන් කිරීමේ කටයුතු ප්‍රමාද වී ඇත්තේ හය වන මහලේ ඇමතුම් මධ්‍යස්ථානය විශේෂිත ගෘහ භාණ්ඩ සහිතව ස්ථාපිත කිරීම හේතුවෙනි. | සංශෝධිත කාල රාමුව තුල නිම කිරීම සඳහා නිතිපතා වැඩ කටයුතු සමීපව |

| | | | |
|---|---|---|---|
| | | | අධීක්ෂණය කිරීම අවශ්‍ය වේ. |

**3.2. කොන්ත්‍රාත් කළමනාකරණය**

| අනු අංක | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශයන් |
|---|---|---|---|
| (අ) | ඉහලම ආදායම් නොලබන දිස්ත්‍රික් මිනුම් ප්‍රදේශ මූලික අදියරේදී හඳුනා නොගැනීම හා ඒවා ප්‍රමුඛතා පදනම මත අවසන් නොකිරීම හේතුවෙන් කොන්ත්‍රාත්තුව ආරම්භ වූ දින සිට මාස 72කට පසුව, 2021 දෙසැම්බර් 31 දින වන විට මීටර 206,229න් මීටර 205,448ක පුනරුත්තාපන කටයුතු නිම කර ඇතත් දිස්ත්‍රික් මිනුම් ප්‍රදේශ 16න් 6ක් ජාතික ජල සම්පාදන හා ජලාප්‍රවහන මණ්ඩලයට පවරා දී තිබූ අතර සමස්ථ ආදායම් නොවන ජලය සැලකිය යුතු මට්ටමකට ද අඩු කර ගැනීමට නොහැකි වී ඇත. | මූලික වශයෙන් දිස්ත්‍රික්ක මිනුම් ප්‍රදේශ මායිම් ලකුණු කර තිබුනද, මුළු කොළඹ නගරයේ නල පද්ධතිය එක් පද්ධතියක් ලෙස ක්‍රියාත්මක විය. එම නිසා එයට වැඩිම ආදායම් නොවන ජල ප්‍රතිශතයක් ඇති දිස්ත්‍රික් මිනුම් ප්‍රදේශය සොයා ගත නොහැකි විය. | සංශෝධිත කොන්ත්‍රාත් කාලය තුල නිම කිරීම සඳහා නිතිපතා වැඩ සම්පව නිරීක්ෂණය කිරීම අවශ්‍ය වේ. |
| (ආ) | ඉහලම ආදායම් නොලබන දිස්ත්‍රික් මිනුම් ප්‍රදේශ මූලික අදියරේදී හඳුනා නොගැනීම හා ඒවා ප්‍රමුඛතා පදනම මත අවසන් නොකිරීම හේතුවෙන් කොන්ත්‍රාත්තුව ආරම්භ වූ දින සිට මාස 65කට පසුව 2021 දෙසැම්බර් 31 දින වන විට මීටර 244,279න් මීටර 221,034ක පුනරුප්තාපන කටයුතු නිම කර ඇතත් දිස්ත්‍රික් මිනුම් ප්‍රදේශ 20න් 4ක් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට පවරා දී තිබූ අතර සමස්ථ ආදායම් නොවන ජලය සැලකිය යුතු මට්ටමකට ද අඩු කර ගැනීමට නොහැකි වී ඇත. | මූලික වශයෙන් දිස්ත්‍රික්ක මිනුම් ප්‍රදේශ මායිම් ලකුණුකර තිබුනද, මුළු කොළඹ නගරයේම නල පද්ධතිය එක් පද්ධතියක් ලෙස ක්‍රියාත්මක විය. ඒම නිසා ඒයට වැඩිම ආදායම් නොවන ජල ප්‍රතිශතයක් ඇති දිස්ත්‍රික් මිනුම් ප්‍රදේශය සොයා ගත නොහැකි විය. | සංශෝධිත කොන්ත්‍රාත් කාලය තුල නිම කිරීම සඳහා නිතිපතා වැඩ සම්පව නිරීක්ෂණය කිරීම අවශ්‍යවේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ව්‍යාපෘතිය යටතේ මාලිගාකන්ද මහල් 06ක් ආදායම් රහිත ජල ගොඩනැගිල්ලේ ඉදිකිරීම් 2018 ඔක්තෝම්බර් 23 දක්වා මාස 18ක් ඇතුලත අවසන් කිරීමට නියමිතව තිබුණු නමුත් 2021 ජුලි 07 දින සිදු කරන ලද භෞතික පරික්ෂණයට අනුව කොන්ත්‍රාත්තුවේ සඳහන් නියමිත නිම කිරීම් දින සිට මාස 28 ක් ගෙවී තිබුනමුත් 2021 ජුලි 07 වන දින තුරු ගොඩනැගිල්ලේ කිසිදු මහලක් සම්පූර්ණයෙන් නිම කර නොතිබුණි. | පසුගිය වසර එකහමාර තුළ වංසංගත තත්ත්වය මත වැඩ බිම් සඳහා දුර්වල සේවක සහභාගීත්වය සහ විදේශ අමුද්‍රව්‍ය නිශ්පාදනය හා ආනයනය කිරීමේ වූ ප්‍රමාදය යනාදී විවිධ හේතු ව්‍යාපෘති ප්‍රගතිය කෙරෙහි බලපෑ ඇත. | වැඩ බිම සඳහා ප්‍රමාණවත් ශ්‍රම බලකායක් යෙදවීමට උපදෙස් ලබා දිය යුතු අතර සංශෝධිත කොන්ත්‍රාත් කාලය තුලදී වැඩ නිම කර ගැනීමට නිතිපතා අධික්ෂණය කිරීම අවශ්‍ය වේ. |

**3.3. බාහිර ක්‍රියාකාරකම් /ව්‍යාපෘති අරමුණු වලින් බැහැර ගෙවීම්.**

| අනු අංක | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශයන් |
|---|---|---|---|
| (අ) | වැඩසටහනේ ව්‍යාපෘති පරිපාලන අත්පොතට අනුව බටහිර මධ්‍යම ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථානයේ ආදායම් නොවන ජලය අඩු කිරීමේ කණ්ඩායම සඳහා ව්‍යාපෘති වැඩසටහන් අංක 01 යටතේ කාර්ය මණ්ඩල කැබ් රථ 07ක් මිලියන 62.90 මිලදී ගෙන ඇත. කෙසේ වෙතත්, රු.මිලියන 17.97 ක වියදමින් සම්පාදනය කරන ලද කාර්ය මණ්ඩල කැබ් රථ 02ක් ව්‍යාපෘති වපසරියට අයත් නොවන සබරගමුව හා ඌව සහය සේවා මධ්‍යස්ථානය වෙත මාරු කර ඇත. | කාර්ය මණ්ඩල කැබ් රථ ආදායම් නොවන ජල කණ්ඩායමට පවරා ගෙන නොතිබුණද, කැබ් රථ ආදායම් නොවන ජල කාර්යයන් වලට අදාලව අනුයුක්ත කර තිබුණි. | ව්‍යාපෘති අරමුණ සඳහා වත්කම් උපයෝගී කරගැනීම අධීක්ෂණය කිරීම සඳහා යාන්ත්‍රණයක් ස්ථාපිත කළ යුතුය. |

**3.4. මත භේදයට තුඩු දෙන කරුණු**

| අනු අංක | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශයන් |
|---|---|---|---|
| (අ) | කොන්ත්‍රාත් ගිවිසුමේ 14.9 වගන්තියට අනුව අර්ධ වශයෙන් සම්පූර්ණ භාර දෙන ලද කොන්ත්‍රාත් වැඩ සඳහා අනුපාතික පදනම රඳවා ගැනීමේ මුදල් නිදහස් කල හැකිය. අයිසීබී - 01 කොන්ත්‍රාත්තුවේ ඇති දිස්ත්‍රික් මිනුම් ප්‍රදේශ (ඩීඑම්ඒ) 16 න් 06ක් නිම කර ජා.ජ.ස.ජ.ම. | රඳවා ගැනීමේ සහතිකය මත රඳවා ගැනීමේ මුදල් ගෙවා ඇත. මෙමගින් කොන්ත්‍රාත්කරුගේ මුදල් ප්‍රවාහය වැඩ දියුණු කිරීමට හැකිවේ. | කොන්ත්‍රාත් කොන්දේසි අනුගමනය කිරීමට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | හි මෙහෙයුම් හා නඩත්තු අංශයට පවරා තිබුණි. කෙසේ වෙතත් කොන්ත්‍රාත් ගිවිසුමට පටහැනි ලෙස සියළු රඳවා ගැනීමේ මුදල් නිදහස් කර තිබුණි. | | |
| (ආ) | ණය ලැබීම් වලින් 2020 දෙසැම්බර් 31 දක්වා රු.මිලියන 75.28ක් ආපසු ලැබිය හැකි තැන්පතු වශයෙන් ගෙවා තිබුණි. එයින් ආපසු අයකර ගත් රු.544,275 ක් භාණ්ඩාගාරයට ආපසු ගෙවනවා වෙනුවට ජා.ජ.ස.ජ.ම. වෙත භාර දී තිබුණි.එම නිසා ව්‍යාපෘතිය අවසානයේදී ණය මුදලින් ගෙවූ ආපසු ලැබෙන තැන්පත් මුදල් ප්‍රමාණය භාණ්ඩාගාරයට ආපසු ගෙවීම වෙනුවට ප්‍රයෝජනයට නොගත් ණය ලැබීමක් ලෙස ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට භාර දී ඇත. | ණය අරමුදල් සහ ශ්‍රී ලංකා රජයෙන් ලැබෙන ලැබීම් හැර ලැබෙන කිසිදු ලැබීමක් ව්‍යාපෘතිය විසින් තබා ගැනීමට හෝ උපයෝගීකර ගැනීමට කල නොහැකි බැවින්, මෙම ආපසු ලැබෙන මුදල් ජා.ජ.ස.ජ.ම වෙත යවනු ලැබේ. ව්‍යාපෘතිය විසින් විගණන ගැටළුව ජා.ජ.ස.ජ.ම. කළමණාකරණයට දැනුම් දීමටත් විගණකවරුන් යාවත්කාලීන කිරීමටත් පියවර ගනු ලැබේ. | ආපසු ගෙවිය ලැබිය තැන්පතු සඳහා ගෙවීම් මිල ප්‍රමාණ පත්‍ර අයිතමයක් ලෙස ඇතුලත් නොකළ යුතු අතර ණය අරමුදල් එවැනි ගෙවීම් සඳහා භාවිතා නොකළ යුතුය. ව්‍යාපෘති කාලය අවසනයේදී අයකර ගත් ශේෂයක් වේ නම්, ඒවා උපයෝජනය නොකල ණය ශේෂයන් ලෙස භාණ්ඩාගාරයට මාරු කල යුතුය. |
| (ඇ) | ආදායම් නොලබන ගොඩනැගිල්ලට ප්‍රවේශ මාර්ගය කො.ම.න.ස. සතු වන අතර 2020 දෙසැම්බර් 31 දින වන විටත් ඒය කොළඹ මහ නගර සභාව වෙතින් ලබා ගෙන නොතිබුනි. එම නිසා අදාල ඉඩම අත්පත් කර ගන්නා තුරු කොළඹ මහ නගර සභාව වෙත මසකට රු. 42,000ක් කුලී ගාස්තු වශයෙන් ගෙවීමට ව්‍යාපෘතිය විසින් එකඟ වී තිබුණි.<br><br>කෙසේ වෙතත් 2018 ජුලි සිට 2020 දෙසැම්බර් 31 දක්වා කාල සීමාවන්ට අදාල මාසික ගාස්තු ගෙවා නොමැති අතර 2020 දෙසැම්බර් 31 දින වන විටත් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබුනි. තවද, අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම සඳහා කො.ම.න.ස. විසින් හිඟ කුලිය පියවන ලෙස ඉල්ලා සිටී. | පාර ගබඩාව සහ අපගේ ගොඩනැගිල්ල සම්බන්ධයෙන් ගරු නගරාධිපතිනිය කො.ම.න.ස. සමඟ සාකච්ඡාවන් කිහිපයක් පවත්වන ලදී. | ව්‍යාපෘති කටයුතු අවසන් අදියරේ පවතින බැවින් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය අවසන් කිරීමට වහාම පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | කොළඹ මහ නගර සභාවේ ඉඩම ව්‍යාපෘති ඉදිකිරීම් සඳහා භාවිතා කර ඇති හෙයින් කොළඹ මහ නගර සභා කාර්ය මණ්ඩල වාහන නැවැත්වීම සඳහා ඉඩමක් කුලියට ලබා දීමට ජා.ජ.ස.හා.ජ. මණ්ඩලයට නාගරික සංවර්ධන අධිකාරිය සමඟ කුලි ගිවිසුමකට එළඹී තිබුණි. කෙසේ වෙතත්, 2020 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාලය සඳහා රු මිලියන 1.12 ක හිඟ කුලී ගාස්තු ගෙවන ලෙස නාගරික සංවර්ධන අධිකාරිය විසින් ඉල්ලීම් කර ඇති අතර එය සමාලෝචිත වර්ෂයේදී ගිණුම් වෙත ගෙනැවිත් නොතිබුණි.<br>තවද, 2019 දෙසැම්බර් 31 දක්වා වාහන නැවැත්වීමේ කුලී ගාස්තු ලෙස රු.මිලියන 4.52ක් මුදලක් ව්‍යාපෘතියන් වෙත ගෙවා ඇත. ව්‍යාපෘතිය විසින් අවසන් අදියරේ පැවතියත් දෙපාර්ශවයම විසින් මෙම කාරණය සම්බන්ධ විසඳුමක් ලබා ගැනීමට කටයුතු කර නොමැත. | මෙම ඉඩම් සම්බන්ධයෙන් ගරු නගරාධිපතිනිය කො.න.ස. සමඟ සාකච්ඡාවන් කිහිපයක් පවත්වන ලදී. | කොළඹ මහ නගර සභා කාර්යය මණ්ඩලයේ වාහන නැවැත්වීමට යොදා ගන්නා මෙම කුලී ඉඩමේ ගැටළුව විසඳීමට වහාම පියවර ගත යුතුය. |
| (ඉ) | අයිසිබී 01 සහ අයිසීබී 02 කොන්ත්‍රාත්තුවල කොන්ත්‍රාත් කොන්දේසි 4.2 වගන්තිය ප්‍රකාරව නිසි ක්‍රියාකාරීත්වය සඳහා කොන්ත්‍රාත්කරු ඔහුගේ වියදමින්) කාර්ය සාධන සුරක්ෂණය ලබා ගත යුතුය. කෙසේ වෙතත් මීට අමතරව ප්‍රමාණ බිල්පත්හි අංක 2.01 දරණ අයිතමය යටතේ සියළුම බැඳුම්කර සහ ඇපකර ගෙවීමට ඊට අමතරව ප්‍රතිපාදන සලසා ඇත.<br>එහි ප්‍රතිඵලයක් ලෙස කොන්ත්‍රාත් කොන්දේසිවල සහ මිල ප්‍රමාණ පත්‍ර පිළියෙල කිරීමේ අපහැදිලිතාවය හේතුවෙන් ව්‍යාපෘතියට කොන්ත්‍රාත්කරුවන්ට බැංකු ගාස්තු වශයෙන් රු.මිලියන 69.22ක් ගෙවීමට සිදු විය. | සමාන්‍යාධිකාරී විසින් පත් කල කමිටුවක් විසින් හේතු සමාලෝචනය කර ඇගයීමෙන් පසුව ගෙවීම් සිදු කිරීම සඳහා අනුමැතිය ලබා දෙන ලදී. | කිසිදු අපහැදිලි භාවයකින් තොරව කොන්ත්‍රාත් ලේඛන සකස් කිරීමට කටයුතු කල යුතුය. |
| (උ) | මිල ප්‍රමාණ පත්‍ර අනුව මිල වැඩි කිරීම් සඳහා වන වෙන් කිරීම යටතේ රු.මිලියන 600ක් වු අතර කාලය දීර්ඝ කිරීම හේතුවෙන්, අයි සී බී 01 සහ අයි සී බී 02 | සාධාරණ හේතු ඇගයීමෙන් පසුව කාල දිගුවක් ලබා දෙන ලදී. ඒ අනුව වියදම් දැරීම සිදු වේ. | කිසිදු අපහැදිලිතාවයකින් තොරව කොන්ත්‍රාත් ලේඛන සකස් කිරීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කොන්ත්‍රාත් සම්බන්ධයෙන් රු.මිලියන 1,060.75ක මුදලක් ගෙවා ඇත. කෙසේ වෙතත් දීර්ඝ කර ලද කොන්ත්‍රාත් කාලය සඳහා වෙනුවට ආරම්භක දිනයේ සිට සියළු අන්තර් ගෙවීම් සඳහා මිල ඉහළ දැමීම් ගෙවා තිබුණි. තවද, එයින් 2021 මැයි 30 දක්වා අවශ්‍ය අනුමැතිය ලබා නොගෙන රු.මිලියන 360.81ක මුදලක් ගෙවා ඇත. එයට අමතරව ව්‍යාපෘතිය දීර්ඝ කිරීම හේතුවෙන් ව්‍යාපෘති මෙහෙයුම් කාර්යාලය එහි කාර්ය මණ්ඩලයට අමතර නඩත්තු කිරීම ඇතුළුව පොදු කාර් වියදම් යටතේ රු.මිලියන 145.73ක මුදලක් ගෙවා ඇත. | | |

**3.5.** **ව්‍යාපෘති කටයුතු ආරම්භ කිරීම/ක්‍රියාත්මක කිරීම/ අවසන් කරීම ප්‍රමාද වීම**

| අනු අංක | විගණන නිරීක්ෂණය<br>----------------- | කළමනාකරණයේ අදහස් දැක්වීම<br>----------------------------- | විගණකගේ නිර්දේශයන්<br>-------------------- |
|---|---|---|---|
| (අ) | 2020 දෙසැම්බර් 31 දින වන විට ව්‍යාපෘතිය විසින් රු.මිලියන 22,317 ක් වැය කර තිබූ නමුත් 2021 මාර්තු 31 දින වන විටත් කොළඹ නගරයේ ආදායම් නොවන ජල ප්‍රතිශතය සියයට 38.87 ක මට්ටමක තිබුණි. එම නිසා ව්‍යාපෘතිය ආරම්භ කර අවුරුදු 8 ක් ගතවී තිබූ නමුත් එය අඩුවී තිබුණේ සියයට 10.13 ක ප්‍රතිශතයක් පමණි. | ආදායම් නොවන ජල ප්‍රතිශතය අඩුවීම සඳහා නැවත සම්බන්ධතා ලබාදුන් දුර ප්‍රමාණය හේතුවෙන් | ඉතිරි වැඩ අවසන් කිරීමට වහම පියවර ගත යුතුය. |

**3.6** **පද්ධති හා පාලනයන්**

| අනු අංක | විගණන නිරීක්ෂණය<br>------------------ | කළමනාකරණයේ අදහස් දැක්වීම<br>---------------------------- | විගණකගේ නිර්දේශයන්<br>------------------- |
|---|---|---|---|
| (අ) | 2020 දෙසැම්බර් 31 දින වන විට අයිසීබී 1 කොන්ත්‍රාත්තුවේ අන්තර් බිල්පත් ගෙවීම් 40 වන විට විචලතා නියෝග 27 ක් මඟින් රු.මිලයන 226.26 ක් ගෙවා ඇත. ඉන් රු.මිලියන 23.45 ක් විචලතා කමිටු අනුමැතීන් ලබාගැනීම් තොරව ගෙවා ඇත. | සමහර අයිතම රේටයන් සඳහා කොන්ත්‍රාත්කරු සමඟ සාකච්ඡා මට්ටමේ පවතී. එම නිසා විචලතා අයිතමයන් අනුමත නොකිරීමේ දඩ වලක්වා ගැනීම සඳහා ඉහත කොටස් අන්තර් බිල්පත් අනුමැතීන් සඳහා ලබා දෙන ලදී. | අදාල අනුමැතීන් ලබාගැනීමට කොන්ත්‍රාත්කරු සමඟ කල යුතු සාකච්ඡාවන් සඳහා කඩිනම් කාර්යක්ෂම යාන්ත්‍රනයක් ස්ථාපිත කිරීම කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2020 දෙසැම්බර් 31 දක්වා නල එළිම් කටයුතු රු.මිලියන 75.28ක මුදලක් ආපසු ලැබිය හැකි තැන්පතු වශයෙන් කොළඹ මහ නගර සභාවට ගෙවා තිබුණි. 2020 දෙසැම්බර් 31 දින වන විට නල එළීම් කටයුතු වලින් සියයට 90 ක් සහ ස්ථාර මාර්ග පුනස්ථාපන කටයුතු වලින් සියයට 75 ක් අවසන් කර තිබුණි. කෙසේ වෙතත් 2020 දෙසැම්බර් 31 දක්වා තැන්පතුවෙන් නැවත අයකර ගෙන තිබුනේ රු.544,275 ක් පමණි. | භාර දෙන ලද මාර්ග සඳහා කොළඹ මහා නගර සභාව වෙත මුදල් ආපසු ගෙවීමේ ඉල්ලීම් මේ වන විටත් ඉදිරිපත් කර ඇත.<br>කෙසේ වෙතත් කොළඹ මහා නගර සභාවෙන් ලැබිය යුතු ආපසු ලැබෙන තැන්පතු සම්බන්ධයෙන් වන ප්‍රමාදය පිළිබඳව ව්‍යාපෘතිය මගින් අවධානය යාමු කර ඇත. | දෙපාර්ශවය විසින් මාර්ග භාරදීම හා තැන්පතු මුදල් ආපසු අයකර ගැනීම සඳහාකාර්යක්ෂම යාන්ත්‍රනයක් ස්ථාපිත කල යුතුය. |
| (ඇ) | 2010 ජුලි 26 දින, අංක 05 දරණ කළමනාකරණ චක්‍ර ලේඛනය ප්‍රකාරව, ව්‍යාපෘති - 01 වැඩසටහනේ ක්‍රියාකාරකම් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශය මගින් විගණනය කර නොතිබුණි. තවද, කළමණාකරණ විගණන දෙපාර්තමේන්තුවේ 2016 ජුනි 10 දඅනැති චක්‍රලේඛ අංක 02/ 2016 ට අනුව අභ්‍යන්තර විගණනකවරයෙකු පත් කිරීමට ව්‍යාපෘති කාර්යාලය පියවර ගෙන නොතිබුණි. | කාරුණාකර මේ සඳහා අමුණා ඇති අභ්‍යන්තර විගණන ප්‍රතිචාරය බලන්න | අභ්‍යන්තර විගණන ක්‍රියාත්මක කිරීමට කටයුතු කල යුතුය. |